02 01181

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2017/2018

සාධාරණත්වයේ මූලධර්ම -LWU1202 / LLU3502

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2020.02.24 වේලාව - පෙ.ව.09.30 -ප.ව.12.30 දක්වා

---

මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 යි.

පළමු කොටසින් තෝරාගත් <u>එක් ප්‍රශ්නයක්</u> හා දෙවන කොටසින් තෝරාගත් <u>ප්‍රශ්න හතරක් (04)</u> ඇතුළත්ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

<u>පළමු කොටස - සාධාරණත්වයේ මූලධර්ම</u>

<u>මෙම කොටසින් එක් (01)ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.</u>

01. සාධාරණත්වයේ ඇතැම් රීති නීතියෙහි රීතිවලට අනුපූරක වූවාට වඩා පරස්පර විරෝධී වීම සිදුවිය. මෙසේ සිදු වූ විට, නීතිය අභිබවා සාධාරණත්වය වලංගු විය යුතු බවට 1873 අධිකරණ සංවිධාන පනතේ 25 වගන්තියෙන් විධිවිධාන සලස්වන ලදී.

ඉංග්‍රීසි නීතිය තුළ තීරණය කරනු ලැබූ නඩු ඇසුරෙන් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02. හෘද සාක්ෂිය අනුව කටයුතු කරන ලෙස තනි පුද්ගලයින්ට නියෝග කරමින්, අයුක්ති සහගත භාවයට ප්‍රතිකර්ම පිණිස චාන්සලර්වරුන් ඔවුන්ගේ බලය ක්‍රියාත්මක කරන ලදී.

සාධාරණත්වයේ ආප්ත ත්‍රිත්වයක් (03) ඇසුරු කරගනිමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

## <u>දෙවන කොටස - භාර නීතිය</u>

<u>මෙම කොටසින් ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.</u>

03. රනිල්ගේ අන්තිම කැමති පත්‍රයෙහි වන පහත පවරාදීම් **(bequests)** මගින් වලංගු භාර නිර්මාණය වන්නේ දැයි සාකච්ඡා කරන්න.

අ. මාගේ උරුමකරුවන්ගේ යහපත වෙනුවෙන් නුවර එළියේ පිහිටි මාගේ තේ වත්ත මාගේ සහෝදරිය වන ඉරෝමා වෙත.

ආ. ඉතාලියේ සිට ශ්‍රී ලංකාවට මා විසින් සොරෙන් ගෙන එන ලද දියමන්ති, පෞද්ගලිකව විකිණීමට සහ ඉන් ලැබෙන මුදල් මාගේ තේ වත්තේ සේවය කරන සේවකයන්ගේ සුභසාධනය පිණිස භාවිත කිරීම සඳහා මාගේ සහෝදර කසුන් වෙත.

ඇ. මාගේ දෙමාපියන්ගේ යහපත වෙනුවෙන් මාගේ දස හැවිරිදි පුතාට රුපියල් මිලියනයක්.

ඈ. කොටස් වෙළඳපොළ තුල ලාභ උපදවන ඕනෑම ව්‍යාපාර තුනක මාගේ ආයෝජනයන්ගෙන් ලැබෙන ආදායම මාගේ මුණුපුරු-මිණිපිරියන්ගේ යහපත වෙනුවෙන් භාවිත කිරීම පිණිස මාගේ භාර්යාව වන සපුමලී වෙත.

(ලකුණු 04 **x** 05 = 20)

04. සිරිපාලගේ පුතා වන තිළිණගේ අර්ථලාභය සඳහා, සිරිපාල 2016 වසරේ දී හික්කඩුවේ පිහිටි 'අරලිය උයන' සහ කොළඹ පිහිටි 'සල්මල් උයන' භාරයක් වශයෙන් නාමල්ට පැවරුවේ ය. 'අරලිය උයන' කැබලි පහකට බෙදා වසර දෙකක් ඇතුලත විකුණා ඒවා විකිණීමෙන් ලැබෙන ආදායම බැංකු ගිණුමක තැන්පත් කරන ලෙස සිරිපාල නාමල්ගෙන් ඉල්ලා සිටියේ ය. 2019 වසරේ දී, එම ප්‍රදේශයේ ඉඩම් මිල පහත වැටුණු අතර නාමල් මුළු ඉඩම කැබලි වලට බෙදා වෙන් නොකොට විකුණුවේ ය. නාමල් එම ආදායම සිරිපාලගේ උපදෙස් පරිදි බැංකු ගිණුමක තැන්පත් කළේය. තවද, 'සල්මල් උයනේ' ආදායම තිළිණගේ අධ්‍යාපනය වෙනුවෙන් භාවිත කරන ලෙස සිරිපාල නාමල්ගෙන් ඉල්ලා සිටියේ ය. කෙසේ නමුත් භාරය පිළිබඳ කිසිදු දැනීමක් නොමැති අකලංකට, නාමල් 'සල්මල් උයන' විකුණුවේ ය. අකලංක, ගයාන්ට එම ඉඩම විකුණුවේ ය. 'සල්මල් උයන' විකිණීමෙන් ලද ආදායමෙන් නාමල් තේ වත්තක් මිල දී ගත්තේ ය.

1917 අංක 09 දරණ භාර ආඥා පනතේ ප්‍රතිපාදන සහ අදාල නඩු තීරණ මත පදනම් වෙමින් තිළිණට උපදෙස් දෙන්න. (ලකුණු 20)

05. භාරකරුවන්ගේ සහ සම භාරකරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන 1917 අංක 09 දරණ භාර ආඥා පනතේ සඳහන් වේ.

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරෙන් ඉහත ප්‍රකාශය සම්බන්ධව අදහස් දක්වන්න. (ලකුණු 20)

06. අ. රුවන් තම පශ්චාත් උපාධි අධ්‍යාපන කටයුතු සඳහා ජපානයට යාමට තීරණය කළ බැවින්, ඔහුගේ සහෝදරයා වන වාමිකට කිසිදු ප්‍රතිෂ්ඨාවකින් තොරව තම රබර් වත්ත පවරන ලදී. රුවන් නැවත ලංකාවට පැමිණි පසු, රබර් වත්ත නැවත පවරා දෙන ලෙස වාමිකගෙන් ඔහු ඉල්ලා සිටියේ ය. වාමික එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරයි.

රුවන්ට උපදෙස් දෙන්න. (ලකුණු 10)

ආ. බදුල්ලේ පවතින සරත්ගේ ඉඩමට අදාල ඔප්පුව දෝෂ සහගත බැවින් ලියාපදිංචි කළ නොහැකි බවට මාතර පදිංචි තම සේවා දායකයා වන සරත්ට නීතිඥයෙකු වන කමල් උපදෙස් ලබා දෙයි. වෙළඳපොළ වටිනාකමට වඩා ඉතා අඩු මිලකට කමල් එම ඉඩම සරත්ගෙන් මිලදී ගත්තේය. ඉන් අනතුරුව, ඔහුගේ ඔප්පුව දෝෂ සහගත නොවන බවත් කමල් විසින් ඔහුට වංචාවක් සිදුකර ඇති බවත් සරත් දැන ගත්තේය.

සරත්ට උපදෙස් දෙන්න. (ලකුණු 10)

07. අ. 1917 අංක 09 දරණ භාර ආඥා පනතේ පුණ්‍ය භාරවලට අදාල ප්‍රතිපාදනවලට අධිකරණය විසින් සපයා ඇති අර්ථ විවරණ මගින් ශ්‍රී ලංකාවේ පුණ්‍ය භාරවල වපසරිය පැහැදිලි ලෙස නිර්වචනය කර ඇත.

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද?

අදාල නඩුතීරණ සඳහන් කරමින් ඔබගේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 15)

ආ. සී ප්‍රේ (සයිප්‍රස්/ **Cy-pres**) සිද්ධාන්තය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

08. පහත ඒවායින් ඕනෑම <u>දෙකක් **(02)**</u> පිළිබඳ සටහන් ලියන්න.

අ. සාධාරණත්වයේ ප්‍රතිකර්ම

ආ. 1917 අංක 09 දරණ භාර ආඥා පනතේ 02 වන වගන්තිය

ඇ. වැඩිදියුණු කිරීමේ පූර්ව නිගමනය

ඈ. 1917 අංක 09 දරණ භාර ආඥා පනතේ 86 වන වගන්තිය

(ලකුණු 02 **x** 10 = 20)

හිමිකම් ඇවිරිණි.